**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**

**-----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

-----------------------------------------

1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සමාලෝචිත වර්ෂයේ අලෙවිසැලේ ගිණුම් වලට අදාලව සංඛ්‍යා සන්සන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

i. 2010 දෙසැම්බර් 31 දිනට පල්ලේකැලේ ගොවිපලේ සත්ව ආහාර තොගය රු.1,894,788ක් වැඩියෙන් ආගණනය කර ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන අතිරික්තයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

ii. කොත්මලේ පැල තවානේ ඉතිරි බිත්තර සහ පැල තොගය විකුණුම් මිලටද, සත්ව ආහාර තොගයේ ඇතුළත් පුන්නක්කු තොගය වැඩි මිළකටද, ආගණනය කිරීම හේතුවෙන් පිළිවෙලින් රු. 374,277 ක් සහ රු. 85,750 ක් වශයෙන් තොගයේ වටිනාකම රු. 460,027 ක් වැඩියෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් ගොවිපල ගිණුමේ පෙන්නුම් කරන ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.

iii. පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ වටිනාකම රු.3,939,000 ක් වූ වාහන හා ලීබඩු වලට අදාල ක්ෂය වටිනාකම වූ රු.958,675 ක් ස්ථාවර වත්කම් ගිණුමට දෙවරක් බැර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.

iv. සමාලෝචිත වර්ෂය තුළ පාවිච්චියට ගන්නා ලද වටිනාකම රු.4,999,350 ක් වූ තොග, වැය ශීර්ෂ වලට හර කිරීමෙන් තොරව ජර්නල් සටහන් 04ක් මගින් සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

v. සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදී ගැනීම පිණිස ලැබී තිබූ රු.1,215,853 ක අරමුදල් ශේෂ පත්‍රයේ ප්‍රාග්ධන ලැබීම් ලෙස ගිණුම්ගත නොකොට ප්‍රාග්ධන ආධාර ලෙස ආදායම් වියදම් ගිණුමේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ප්‍රාග්ධන ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද පෙන්නුම් කෙරේ. තවද ස්ථාවර වත්කම් මිලදී ගැනීම පිණිස භාණ්ඩාගාරයෙන් ලද රු. 19,402,428 ක සමුච්චිත ප්‍රදාන ශේෂ පත්‍රයේ අරමුදල් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1983 වර්ෂයේදී ගම්පල නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී තිබූ රු.13,501ක් වූ ණය ශේෂ 02 ක් තවදුරටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියෙන් ඉවත්ව ගොස් සිටින සේවකයන් 03 දෙනෙකුගෙන් වර්ෂ 05 කට අධික කාලයක සිට අයවිය යුතුව තිබූ රු.3,150 ක උත්සව අත්තිකාරම් ශේෂයක්ද, අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගොස් සිටින සේවකයින් 04 දෙනෙකුගෙන් වර්ෂ 02ත් 05 ත් අතර කාලයක සිට අයවිය යුතුව තිබූ රු.4,300 ක විශේෂ අත්තිකාරම් ශේෂයක් ද තවදුරටත් නිරවුල් නොවී පැවතුණි.

(ඇ) 1989 වර්ෂය තුළ ලෝක ආහාර සංවිධාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම උදෙසා සේවකයන් 15 දෙනෙකු බඳවා ගෙන තිබුණද, 1996 වර්ෂයෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම සේවකයන් ඉවත් කරන ලදි. ඔවුන් සඳහා අධිකාරිය මගින් ප්‍රදානය කරන ලද ආපදා ණය වලින් අයවිය යුතුව තිබූ රු.217,903ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු නොකර පොත්පත් වලින් කපා හැරීමට ක්‍රියා කොට තිබුණි.

(ඇ) ද්විතීයන පදනම මත බඳවාගෙන 1996 වර්ෂයේදී සේවයෙන් ඉවත් කරන ලද නිලධාරීන් 03 දෙනෙකුට වැඩිපුර ගෙවන ලද රු.97,950 ක ද්විතීයන දීමනා මුදලින් සමාලෝචිත වර්ෂය තුල කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන රු.27,862 ක කෙසෙල් පැල අලාභය හා පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරෙන් අයවිය යුතුව තිබූ රු.54,515 ක මුදල සමාලෝචිත වර්ෂයේද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු.11,769,650 ක අතිරික්තයක් ලැබී තිබූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.2,388,756 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ රු.14,158,406 ක වර්ධනයක් පැවතුණි. මෙම අතිරික්තයට ප්‍රධාන හේතුව වී තිබුණේ 2010 වර්ෂයේ ප්‍රග්ධන හා විශේෂ ව්‍යාපෘති සඳහා ලද රු.69,219,743 ක මුදල ආදායම් ලෙස ගිණුම්ගත කිරිම හා එහිදී රු.13,634,011 ක මුදලක් ඉතිරිවීම හේතුවෙනි. එසේම මෙම වාර්තාවේ 1.2 ඡේදය යටතේ දැක්වෙන මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම් හා අනෙකුත් දෝෂ නිසා මෙම අතිරික්තයේ නිවැරදිතාවය පිළිබඳවද සෑහීමට පත්විය නොහැකි විය.

2.2 මෙහෙයුම් සමාලෝචනය

2.2.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) ක්ෂේත්‍රයට රෝපණ ද්‍රව්‍ය නිකුත් කිරීමේදී සමීක්ෂණ වාර්තා අධ්‍යයනය කොට ගොවීන් සංඛ්‍යාව හා ඉඩම් ප්‍රමාණය, සැලකිල්ලට ගෙන රෝපණ ද්‍රව්‍ය නිකුත් කළ යුතු වුවද ඊට පටහැනිව යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉඩම් ප්‍රමාණයට සාපේක්ෂව බීජ ඉතා වැඩි ප්‍රමාණයක් නිකුත් කර තිබුණි.

(ආ) ක්ෂේත්‍ර නිලධාරීන්ට නිකුත් කරන ලද රෝපණ ද්‍රව්‍ය නිසි ලෙස බෙදා හරින ලද්දේද හා ඉතිරි රෝපණ ද්‍රව්‍ය ආපසු ගෙනවිත් භාර දෙනු ලබන්නේද යන්න පිළිබඳව ප්‍රධාන කාර්යාලය මගින් නිසි අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධව කරන ලද භෞතික පරීක්ෂාවේදී යටවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බෙදා නොහැරී අමු මිරිස්, කරවිල, බුසිටා මැ වර්ග වලට අයත් බීජ කිලෝ ග්‍රෑම් 5.8 ක් ආපසු භාරදී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පල්ලේකැලේ අලෙවිසැල, අධිකාරියේ සුභසාධක සංගමය මඟින් මාස 02 ක් වැනි කෙටි කාලයක් පවත්වාගෙන ගොස් තිබුණද, ඉන් අනතුරුව එහි අලෙවි කටයුතු අත්හැර දමා තිබූ අතර වර්ෂය තුල වෙනත් පාර්ශවයකට අලෙවි සැල පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියට ලැබිය යුතු කුලී ආදායම් හෝ අලෙවි ආදායම් අහිමි වී තිබුණි.

(ඈ) 2003 හා 2005 වර්ෂවල කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද රු.2,200,000 ක් වටිනා ජීප් රථයක් හා පැජරෝ රථයක් විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි.

2.2.2 නිෂ්කාර්ය වියදම්
------------------

කොත්මලේ ගොවිපලේ ගොවි පුහුණු කටයුතු සඳහා ඉදිකිරීමට නියමිතව තිබුණු ගොඩනැගිල්ලේ මූලික ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ඇස්තමේන්තු ගත මුදලින් 20% ක් එනම් රු.459,914 ක් 2004 දෙසැම්බර් මාසයේදී වැය කර තිබුණු අතර, අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා 2011 ජනවාරි වන විටත් එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

2.2.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
---------------------------------------

පිරිවැය රු.75,000 ක් වූ ට්‍රැක්ටරයක් හා රු.82,500 ක් වූ මෝටර් සයිසිකලයක් 2010 වර්ෂය තුල ධාවන තත්ත්වයේ නොපැවති අතර, එම වාහන අළුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට හෝ වෙන්දේසි කිරීමට හෝ කටයුතු නොකර වර්ෂ 02 කට ආසන්න කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

2.2.4 හඳුනාගන්නා ලද පාඩු
-------------------------

(අ) 2010 වර්ෂයේ පාංශු සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ ගොවීන් අතර බෙදාහැරීම සඳහා යටවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බටහිර ඇතිපොල ග්‍රාම සේවා කොට්ඨාශය සඳහා මිලදී ගන්නා ලද විවිධ වර්ග වලට අයත් බීජ වලින් රු.35,904 ක් වටිනා බීජ කිලෝ 13 ග්‍රෑම් 665 ක් 2010 නොවැම්බර් 25 වන විටත් ගොවීන් අතර බෙදා හැර නොතිබීමෙන් ඒවා යල් පැන ගොස් පැවති අතර, මෙම කොට්ඨාශයේම 2010 නොවැම්බර් 25 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී ගොවීන් අතර බෙදා දුන් බවට අත්සන් ලේඛනවල පෙන්වා තිබූ රු.8,979ක් වටිනා බීජ එසේ බෙදා දී නොතිබූ බව අනාවරණය විය.

(ආ) 2010 සැප්තැම්බර් මස තුල පැල අලෙවි සැලේ කරන ලද භෞතික පරීක්ෂාවේදී වර්ග 07 කට අයත් පැල 2800 ක ඌනතාවයක් පැවති අතර එක් වර්ගයකට අයත් පැල 108 ක අතිරික්තයක්ද පැවතුණි.

2.2.5 කාර්ය සාධනය
---------------
පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අධිකාරිය වෙත රු.37,117,376 ක මුදලක් ලැබී තිබූ අතර, ව්‍යාපෘති සඳහා අවශ්‍ය දේශීය බීජ හා රෝපණ ද්‍රව්‍ය අධිකාරියේ අවශ්‍යතාවයට සරිලන පරිදි මිලදී ගැනීමට නොහැකි වීම, දැඩි නියඟයේ බලපෑම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා සමහර ව්‍යාපෘති 2010 අගෝස්තු මස ආරම්භ කිරීම, ආදී හේතූන් මත වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණේ රු.31,274,833 ක් වටිනා ව්‍යාපෘති 10 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 5,842,543 ක මුදලක් ආපසු අමාත්‍යාංශය වෙත යවා තිබුණි. ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහාද ද්‍රව්‍ය මිලදී ගැනීමේදී විශාල ප්‍රමාදයක් පැවති අතර එය දින 43 ත් 230 ත් අතර පරාසයක විය.

(ආ) ජල ටැංකි ව්‍යාපෘතිය 2011 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ අතර, ද්‍රව්‍ය මිලදී ගැනීම ප්‍රධාන කාර්යාලය මගින් සිදුකර ක්ෂේත්‍රයට බෙදා හැරීම අධිකාරියේ හා පුද්ගලික අංශයෙන් ලබාගත් ලොරි රථ මගින් සිදු කර තිබුණි. ආර්ථික වශයෙන් වඩා ලාභදායී ක්‍රමවේදයක් අනුගමනය නොකර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් වැඩි පිරිවැයක් සහ කාලප්‍රමාදයක් සිදුව ඇති බව නිරීක්ෂණය වූ අතර, 2011 ජූනි 30 වන විටද බෙදා නොහැරි සිමෙන්ති මිටි 253 ක් ගබඩාවේ පැවතුණි.

2.2.6 අයවැය පාලනය
------------------

අයවැය ඇස්තමේන්තු හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ බැවින්. අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන
-------------------

විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පද්ධති හා පාලන පිළිබඳ ඌනතා වරින් වර මාගේ වාර්තා මගින් සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම් තැබීම

(ආ) පාංශු සංරක්ෂණ ව්‍යාපෘති හා විශේෂ ව්‍යාපෘති

(ඇ) රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම

(ඈ) තොග පාලනය